839

Add - Director

27 FEB 2019

මාගේ
නේවාසික ව්‍යාපාර කළමන
කවු

කවුඩුලු වැව ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම/මහත්මීන් වෙත.

## මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටුව 2019 ජනවාරි 10 - කවුඩුලු වැව ව්‍යාපාරය

1994 අංක 13 දරණ වාරිමාර්ග(සංසෝධන)පනතට අනුකූලව කවුඩුලු වැව මහා වාරිමාර්ග ව්‍යාපාරයේ මාසික ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම 2019.01.10 කවුඩුලු වැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ රැස්වීම් ශාලාවේදී නේවාසික ව්‍යාපාර කළමනාකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

### සහභාගී වූ රාජ්‍ය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ආයතනය |
|---|---|---|---|
| 1. | ආර්.ඩී.කේ.රාජසූරිය | නේවාසික ව්‍යාපාර කළමනාකරු | ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 2. | පි.පී.දඹෝරගම | වාරිමාර්ග ඉංජිනේරු | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |
| 3. | ඩබ්.කේ.එස්.එන් කුමාර | සංවර්ධන නිළධාරී | ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය |
| 4. | ඊ.ඩී.එම්.විමලධර්ම | තාක්ෂණ සහකාර | කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| 5. | එච්.ඒ.ආර්.ප්‍රදීප් | ඉංජිනේරු සහකාර | වාරිමාර්ග ප්‍රාදේශීය කාර්යාලය - කවුඩුල්ල |

### සහභාගී වූ ගොවි සංවිධාන නියෝජිත මහතුන්

| අනු අංකය | නම | තනතුර | ගොවි සංවිධානය |
|---|---|---|---|
| 1. | එච්.එම්.විජේසිංහබණ්ඩා | ගරු සභාපති | සි.පි.පුර පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 2. | අනුර විජේතිලක | ගරු ලේකම් | සි.පි.පුර පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 3. | ජී.ඒ.ෂෙල්ටන් පෙරේරා | ගරු සභාපති | කාලිංග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 4. | එච්.එම්.මාලනී වටවල | ගරු ලේකම් | කාලිංග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 5. | ආනන්ද ශ්‍රී ධර්මසේන | ගරු සභාපති | රංකෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 6. | එස්.එම්.සමන් සමරකෝන් | ගරු සභාපති | මණ්ඩලගිරිය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 7. | ජේ.පී.සේනාරත්න | ගරු සභාපති | සුභද එක්සත් බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 8. | සුමිත් චන්දන බණ්ඩාර | ගරු සභාපති | ශ්‍රී නාග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 9. | ඒ.ඩබ්.සිසිර ජයරත්න | ගරු ලේකම් | ශ්‍රී නාග බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 10. | යූ.ඕ.ජී.වික්‍රමසිංහ | ගරු ලේකම් | විජයපුර විජය බෙදුම් ඇළ ගොවි සංවිධානය |
| 11. | ඩිංගිරි බණ්ඩා | ගරු සභාපති | විජිත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 12. | ජී.ධර්මසිරි ගුණරත්න | ගරු සභාපති | මැණික්සොරොව්ව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 13. | එම්.යූ.ජී.දසනායක | ගරු ලේකම් | මැණික්සොරොව්ව බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 14. | එම්.කේ.විද්‍යාරත්න | ගරු සභාපති | සාම බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 15. | ඒ.ඇම්.සිරිසේන | ගරු භාණ්ඩාගාරික | ගොවිසෙත බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 16. | එස්.ඩබ්.චමින්ද සරත් | ගරු සභාපති | මහවැලි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 17. | ආර්.එම්.පි.ජී.ශාන්ත සරත් රත්නායක | ගරු ලේකම් | මහවැලි බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 18. | එච්.ඩබ්.පොඩි මහත්තයා | ගරු සභාපති | මහින්දපුර බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 19. | එල්.ජී.ජයවර්ධන | ගරු ලේකම් | මහින්දපුර බෙ[illegible]ල ගොවි සංවිධානය |
| 20. | කේ.එම්.ඒ.ජී.සෙනවිරත්න | ගරු සභාපති | ප්‍රගති බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 21. | කේ.එම්.යූ.කරුණානායක | ගරු ලේකම් | ප්‍රගති බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 22. | යූ.ජී.එන්.යූ.කුමාර | ගරු සභාපති | පුබුදු බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 23. | යූ.ජී.වසන්ත උදය කුමාර | ගරු සභාපති | ඩී.එස්.සේනානායක බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 24. | කේ.ජ්.එස්.කළුආරච්චි | ගරු ලේකම් | ඩී.එස්.සේනානායක බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 25. | අනුර බණ්ඩාර | ගරු ලේකම් | ශ්‍රී විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 26. | එච්.සෝමදාස | ගරු භාණ්ඩාගාරික | ශ්‍රී විජය බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 27. | එම්.එච්.ජී.ධම්මික අරුණ ශාන්ත | ගරු සභාපති | නාගරපුර සහන බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 28. | ජී.ආර්.ප්‍රසාද් ප්‍රියන්කර හේරත් | ගරු ලේකම් | නාගරපුර සහන බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 29. | ඩබ්.ජී.රම්‍යානි ධම්මිකා | ගරු ලේකම් | වීරකැප්පෙටිපොල බෙදුම් ඇල ගොවි සංවිධානය |
| 30. | බී.ජී.ශාන්ත සිසිර කුමාර | ගරු භාණ්ඩාගාරික | එක්සත් බෙදුම් ඇළ ගොවි සංවිධානය |



පළමුව ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකරු ආර්.ඩී.කේ.රාජසූරිය මහතා විසින් පැමිණි රාජ්‍ය නිලධාරීන් හා ගොවි සංවිධාන නිලධාරීන් පිළිගන්නා ලදි

### අරමුණ පැහැදිලි කිරීම:- (නේවාසික ව්‍යාපාර කළමනාකරු)

- 2019 වර්ෂයට අදාළ ව්‍යාපාර කමිටු රැස්වීම් දින කාල සටහන ගොවි සංර්විධාන වලට සහ අදාළ රාජ්‍ය ආයතනවට ලිපිමඟින් දැනුවත් කිරීම සිදු කළා.
- වාරිමාර්ග ගැටළු,කෘෂිකාර්මික ගැටළු හා සේවා සැපයුම් පිළිබඳව සාකච්ඡා කිරීම.
- ගොවිජනසේවා දෙපාර්තුමේන්තුවේ නිළධාරීන් අද දින ව්‍යාපාර කමිටු රැස්වීම සඳහා සහභාගී වී නොමැත.
- අදාළ ආයතන නොමැති වුවත් රැස්වීම ඉදිරියට පවත්වාගෙන යනවා.
- වර්ෂය පුරාවට යම් සැළැස්මකට අනුව කටයුතු කළත් ඒ සඳහා ගොවීන්ගේ උනන්දුවක් නොමැත.
- ගොවි සංවිධා ශක්තිමත් කිරීමෙන් සෑම ආයතනයකටම පහසුවක් වනවා.
- බයෝ පිල්ම් ආයතනය හා බයෝ මාක්ස් ආයතනය අද ව්‍යාපාර කමිටුවේ විශේෂ දැනුවත් කිරීමක් සිදු කරණවා.

### පසුගිය වාර්ථාව සමාලෝචනය කිරීම.

- පොහොර හිඟය.
  - මේවන විට පොහෙර ගැටළුව විසඳී ඇත.(නේවාසික ව්‍යාපාර කළමනාකරු)
- වාන් ඇළේ ගස් ඉවත් කිරීම.

- මෙම ගැටළුව සම්බන්දයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමුකර ඇත.මේ සඳහා උපදෙස් ලැබීමෙන් පසු අදාළ ගස් ඉවත් කිරීමට හැ ඉංජිනේරු - කවුඩුල්ලු වැව)

- **ඇළවේල්ලේ ගවයන් බැඳීම.**
  - නීතිමය වශයෙන් මේ සඳහා ඉදිරියේදී කටයුතු කරණවා. (වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුල්ලු වැව)
  - ගවයන් අත්අඩංගුවට ගෙන අලාභය අයිති කරුගෙන් ලබාගැනීමටත් එසේ නොවන්නේනම් ගවයන් වෙන්දේ ිරීමටත් හැකියාව අත.එමෙන්ම අයි දේපල යටතේ නඩු පැවරීමටද පුලුවන. (නේවාසික ව්‍යාපාර කළමනාකරු)

- **පිකප් ඇණිකට් එක අසල උද්‍යානයක් සැකසීම.**
  - ඒ පිළිබඳව යේජනා ඉදිරිපත් කර ඇත. (වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුල්ලු වැව)

- **රොන්මඩ ඉවත් කිරීමට වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ යන්ත්‍ර ලබාගැනීම.**
  - කාලිංහ බෙදුම් ඇළ ගොවි සංවිධානයේ සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතින අවස්ථාවේ 70යන්ත්‍රයට සිදු කළ අලාභ හානිය නිසා මෙන්ම එම අලාභ නොහැකි වීමත් කිසිදු වගකිව යුත්තෙක් ඉදිරිපත් නොවීමත් නිසා කිසිද් යන්ත්‍රයක් කිසිදු ගොවි සංවිධානයකට ලබාදීමට නොහැකි වී ඇත. (වාරිම කවුඩුල්ලු වැව)
  - අප ගොවි සංවිධාන බලප්‍රදේශයේදී සිදු වුවත් සි.පි.පුර පැරකුම් ගොවි සංවිධානයේ ගොඩඉඩම් සඳහා ජලය ලබාගන්නා පුද්ගලයෙක් හෝ පිරිසක් විසි ඇත.(ගරු සභාපති - කාලිංග බෙදුම් ඇළ ගොවි සංවිධානය)
  - වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ 70යන්ත්‍රයට හානි කිරීම නිසා සියළුම ගොවි සංවිධාන වලට අසාධාරණයක් සිදු වී ඇත. (නේවාසික ව්‍යාපාර කළමනා
  - කුහක පුද්ගලයෙකු විසින් යන්ත්‍රයට හානි කර ඇත.ඒකාබද්ධ ගොවි සංවිධානය විසින් මේ සම්බන්ධයෙන් පියවර ගත යුතුයි.දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව ගොවි සංවිධානය විසින් මේ සම්බන්ධයෙන් කතානොකිරීම සම්බන්ධයෙන් කණගාටුවෙනවා. (ගරු සභාපති - කාලිංහ බෙදුම් ඇළ ගොවි සංවිධානය
  - වාරිමාර්ස දෙපාරතුමේන්තුවේ අදාළ යනත්‍රය නිකුත් කර ඇතේ ඒකාබද්ධ ගොවි සංවිධානයට නොව කාලිංහ බෙදුම් ඇළ ගොවි සංවිධානයට බ කාලිංහ බෙදුම් ඇළ ගොවි සංවිධානය විසින් බාරගෙන අදාළ කටයුතු කළයුතුයි.(ගරු සභාපති - රංකෙත බෙදුම් ඇළ ගොවි සංවිධානය)
  - දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කළත් විසඳුමක් නොලැබෙන බැවින් ඇමති වරයාට මෙම ගැටළුව ඉදිරිපත් කර විසඳුම් ලබ කරමු.(ගරු ලේකම්-ඒකාබද්ධ ගොවි සංවිධානය)
  - මෙම හානිය සිදුවී ඇත්තේ ගොවි සංවිධානයකට ලබාදීමෙන් බැවින් රජයෙන් යම් සහනයක් ලැබේවියැයි විස්වාස කරනවා. (වාරිමාර්ග ඉංජිනේරු -

- **3ඒ ඇලේ සංවර්ධන කටයුතු සිදුනොවීම.**
  - මාර්තු මාසය වන විට CRIP ව්‍යාපෘතිය අවසන් වන බැවින් එම මාසයට පෙර සංවර්ධන කටයුතු අවසන් කළයුතුයි.එසේ නොවන්නේනම් පොලො වැඩසටහන යටතේ ඉදිරියේදී සිදු කරණවා(වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුල්ලු වැව)
- **කිරුළ කොන්ත්‍රාත් සමාගම විසින් සිදු කරණ ඉදිකිරීම් කටයුතු.**
  - අදාළ ආයතනය මගින් සිදු නොකරණ වැඩ කොටස් පොලොන්නරුව සංවර්ධන වැඩසටහන යටතේ සිදු කරනවා. (වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුල්ලු
- **පුරුක්පනු හානිය.**
  - ගොවි සංවිධාන 24කම දැනුවත් කිරීම් සිදු කළ අතර කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවට මේ සම්බන්ධයෙන් විශේෂ ස්තුතියක් සිදුකළ යුතුයි. (නේ කළමනාකරු)



- **PEISEI ව්‍යාපෘතිය.**
  - මූලික දත්ත සමීක්ෂණ හා පදනම් දත්ත සමීක්ෂණයේ පොත් මුද්‍රණය කටයුතු ලබන සතිය තුළ සිදු කර අවසන් කරණවා. (නේවාසික ව්‍යාපාර කළමනාකරු)

<u>ආයතන සංවර්ධන කටයුතු</u>

- 2019 වර්ෂයට අදාළ ක්‍රියාත්මක සැළැස්ම ඉදිපත් කිරීම හා ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීම.
- පසුගිය 2018 වර්ෂයේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම.
  - අප ගොවි සංවිධානයේ 2018 වර්ෂයේ මාසික කමිටු රැස්වීම් 06 පමණ පවත්වා ඇතත් ලේකම් මහතා වාර්තා ාදීම නිසා ගැටළු මතුවී ඇත.කමිටු රැස්වීම් මාස 02කට වරක් පැවැත්වීමට සුදුසු යැයි යෝජනා කරණවා.(ගරු සභාපති - සාම බෙදුම් ඇළ ගොවි සංවිධානය)
  - මාසික කමිටු රැස්වීම් මසකට වරක් පැවැත්විය යුතුයි ඒ පිළිබඳව ගොවි සංවිධාන ව්‍යවස්ථාවේ කාර්ය පටිපාටියේ සඳහන් කර ඇත. (නේවාසික ව්‍යාපාර කළමනාකරු

<u>ගොවිජන සේවා දෙපාර්තුමේන්තුව.</u>

- කිසිදු වගකිවයුතු නිළධාරියෙක් පැමිණ නැත.

<u>වාරිමාර්ග දෙපාර්තුමේන්තුවේ අදහස් ඉදිරිපත් කිරීම:- *(වාරිමාර්ග ඉංජිනේරු - කවුඩුලු වැව)*</u>

- අදවන විට කවුඩුලු වැව ජලාශයේ අක්කර අඩි 92600ක් පවතිනවා.
- තවත් මුර 07ක් දීමට ඇත.
- මුර 07 නිකුත් කිරීම සඳහා අක්කර අඩි 25000ක් අවශ්‍යයි.
- ලබන යල කන්න සඳහා අක්කර අඩි 65000ක් ජලාශයේ ජලය ඉතිරි වෙනවා.
- මෙම වර්ෂයේ කිරීමට අවශ්‍ය සංවර්ධන කටයුතු සඳහා යෝජනා සතියක් තුළ ලබාදීමට කටයුතු කරන්න.
  - අවශ්‍යම යෝජනා පමණක් ලබාදීමට කටයුතු කරන්න කාරක සභාවේ අනුමැතිය ලබාගන්න. (නේවාසික ව්‍යාපාර කළමනාකරු)

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු සභාපති - සි.පි.පුර පැරකුම් බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • ජලය අපතේ යන විශේෂ ස්ථා කිහිපයක් හඳුනාගෙන ඇත. | • අදාළ විස්තර ලබාදීමට කටයුතු කරන්න | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |
| ගරු සභාපති - මණ්ඩලගිරිය බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • සංවර්ධන කටයුතු මාස් කන්නයේ වර්ෂාව පටන් ගැනීමට පෙර සිදු කිරීමට කටයුතු කරන්න. | • මාස් කන්න ආරම්භ වීමට පෙර අවසන් කිරීමට කටයුතු කරණවා. | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |
| ගරු සභාපති - කාලිංහ බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • ස්කෑවේටරය අළුත්වැඩියා කිරීමට කටයුතු කරණවා. | • ඒ පිළිබඳව සතුටු ප්‍රකාෂ කර සිටිනාවා. | • වාරිමාර්ග දෙපාර්තුමේන්තුව |

<u>කෘෂි කර්ම දෙපාර්තුමේන්තුව - කෘෂි උපදේශක</u>

- 2018.12.20 හා 21 දෙදින පලිබෝධ හානි පිළිබඳව ගොවි සංවිධාන දැනුවත් කළා.

- මේවන විට ක්ෂේත්‍රයට දින 40 – 50ක් වී ඇති නිසා වගාව හොඳින් බලාගත යුතුවෙනවා.
- ගොයමේ කොළ හකුලන දළඹුවා සිටිනවා නමුත් ගොවීන් කෘමිනාශක යෙදන්නේ සළඹයාට.
- පලිබෝධහානි දැනුවත් කිරීම් වැඩසටහන් සංවිධානය කරන්න.
- නෙමටෝඩා හානිය වාර්තා වෙනවා.ඒ සඳහා විසඳුම වන්නේ කාබනික පොහොර යෙදීමයි.
- ගොබ කුනුවීමේ රෝගයද ක්ෂේත්‍රයේ දක්නට ඇත. වැරදි අවබෝධයෙන් කෘමිනාශක නොයොදන්න.
- කෘමිනාශක නිතර නිතර යෙදීමෙන් වලකින්න.

| ඉදිරිපත් කළ අය | ගැටලුව | විසඳුම | වගකීම |
|---|---|---|---|
| ගරු සභාපති - එක්සත් ගොවි බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • පොටෑස් කියා ගොවීන්ට යූරියා කුඩුකර ලබාදී ඇත.මේ නිසා අස්වැන්න අඩුවේවි.<br>• පසුගිය කන්නයේද කෘමීන් නිසා හානි පැමිනියා.<br>• මෙම කන්නයේ අස්වැන්න නිසා හානි පැමිණේවි.<br>• ඒකාබද්ධ ගොවි සංවිධාන විසින් ඉදිරියේදී ව්‍යාජ පොටෑසියම් සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කළයුතුයි. | • පොහොර පිළිබඳව තත්ව සහතික ලබාගැනීමෙන් පසුයි ගොවීන්ට ලබාදෙන්නේ.මේ පිළිබඳව ඉහළ නිළදාරින් දැනුවත් කරීමට කටයුත් කරනවා. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| ගරු ලේකම් - ශ්‍රී නාග බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • පොටෑස් ගබඩා කර තැබීමේදී දිය නොවන අතර මෙවර ලබාදී ඇති පොටෑස් දියවෙනවා.<br>• පලාත් කෘෂිකර්ම දෙපාර්තුමේන්තුවේ කෘෂිකර්ම උපදේශක මහතා සුදුපාට පොටෑස් තිබෙන බව ප්‍රකාෂ කළා. | • ඒ පිළිබඳව සොයාබලා කටයුතු කරනවා. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| ගරු සභාපති - සි.පි.පුර පැරකුම් බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • බිත්තර වී බීජ පැකට් ලබාදීම පරක්කු වූවා,බීජ පැකට් ලබාදෙන විටත් ගොවීන් වපුරා අවසන්. | • මේ සම්බන්ධයෙන් කණගාටුවෙනවා. ගබඩාවෙන් අප කාර්යාලයට බිත්තර වී පරක්කුවී ලැබුනේ. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |
| ගරු ලේකම් - අරුණළු බෙදුම් ඇළ ගොවි සංවිධානය. | • සින්ක් සල්පේට් මේ අවස්ථාවේ යෙදීම සුදුසුද. මේ පිළිබඳව කන්න රැස්වීම් දැනුම් දෙන මහා සභා රැස්වීමේදී දැනුවත් කිරීමට කටයුතු කරන්න. | • සින්ක් යෙදීම මුල් අවස්ථාවේදීම සිදු කළයුතුයි. | • කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව |

<u>වෙනත් ගැටළු ඉදිරිපත් කිරීම</u>

**1.**

- මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් අප ගොවි සංවිධානයේ ගිනුම් අත්හිටුවීමට අපගේ ගිණුම් ඇති ලංකා බැංකුවට හා මහජන බැංකුවට උපදෙස් ලබාදී
- අප සංවිධානය විසින් සේවා පියසක් ඉදිරිමේ කටයුත්තක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති අතර එයින් 2%ක කොමිස් මුදල් ලබානොගන්නා ලෙස දන්වි
- අදාළ සංවර්ධන කටයුත්ත උප කොන්ත්‍රාත් කරුවෙකු විසින් සිදු කළ බැවින් 2%ක කොමිස් මුදළ ලබාගැනීම සිදු කළා.මේ නිසා ගිණුම් අත්හිටුවන්නට කරනවා.
- ගිණුම් අත්හිටවීම සම්බන්ධයෙන් දන්වා ඇති ලිපියේ ඊට අදාළ හේතු කිසිවක් දන්වා නොමැත.<u>(ලේකම් - ප්‍රගති බෙදුම් ඇළ ගොවි සංවිධානය)</u>



**2.**

- මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් ගිවිසුම්ගත වූ ගොවි සංවිධාන කැඳවා සේවා පියස් ඉදිකිරීමේ වැඩසටහනින් කොමිස් මුදල් ලබානොගන්න ලබාදුන්නා. <u>(ගරු සභාපති - කාලිංග බෙදුම් ඇළ ගොවි සංවිධානය)</u>

**3.**

- අප සංවිධානයටද අප වසමේ ක්ෂේත්‍රයේ රාජකාරි සිදු කරණ රාජ්‍ය නිළධාරීන් මේ පිළිබඳව දැනුවත් කිරීම ස_ කළා. <u>(ගරු සභාපති - සාම බෙදුම් ඇළ</u>

**4.**

- මෙම සංවර්ධන කටයුත්ත සඳහා ස්වෙච්ඡාවෙන් ගිවිසුම් අත්සන් කළ නමුත් මේ වන විට අප සංවිධානය අපහසුතාවයට පත්වී ඇත. කොමිස් මුදල් ලෙ කිරීම නිසා කිසුදු සංවිධානයක් මේ සඳහා කැමැත්ත ප්‍රකාෂ කර නොමැත. <u>(ගරු සභාපති - මහවැලි බෙදුම් ඇළ ගොවි සංවිධානය)</u>

**5.**

- මෙම සංවර්ධන වැඩසටහන් උපකොන්ත්‍රාත් කරුවන් විසින් සිදු කරනවා.
- ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුයි කොමිස් මුදල් ලබානොගන්නාමෙන් ප්‍රකාශ කළේ.
- මුලදී 2300000.00කට ඇස්තමේන්තු කළ වමුත් මෙයින් රැපියල් 300000.00ක් අඩුකර කොන්ත්‍රාත්තුව ලබාදී ඇත.නමුත් අඩු කර ඇති මුදල ලබාදෙනවා.
- ලාබ නොමැතිනම් උප කොන්ත්‍රාත් කරුවන් විසින් එම කාර්යය සිදු කරන්නේ ඇයි.
- වසමේ නිළධාරීන් ශ්‍රමයද යොදාගෙන සිදු කරන්නේනම් කොමිස් මුදල් ලබානොගැනීමට කටයුතු කරන්න. <u>(ගරු සභාපති - පුබුදු බෙදුම් ඇළ ගොවි</u>

**6.**

- උපකොන්ත්‍රාත් කරුවන් විසින් සිදු කරණ කොන්ත්‍රාත්(සේවා පියස)වලින් 2% කොමිස් මුදල් ලබාගත යුතුයැයි යෝජනා කරනවා. <u>(ගරු සභාපති - ර</u> <u>ගොවි සංවිධානය)</u>
- එම ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරනවා. <u>(ගරු ලේකම් - ප්‍රගති බෙදුම් ඇළ ගොවි සංවිධානය)</u>
- • - ගොවි සංවිධානක සම්පූර්ණ බලය ගොවිජනසේවා කොමසාරිස් සතුව ඇත.
- ගොවි සංවිධානයක සියළුම කාර්යයන් සිදු කරණුයේ වාරිමාර්ග කළමනාකරණ අංශය මඟින්.
- ගිවිසුම් අත්සන් කිරීමේදී සැළකිළිමත් වන්න. (නේවාසික ව්‍යාපාර කළමනාකරු)

<u>**BIO MASS ආයතනය.**</u>

- ග්ලිරිසිඩියා මඟින් විදුලිය උත්පාදනය මූලික අරමුණයි.
- මෙයින් ගොවීන්ට ප්‍රතිලාභ රැසක් ලැබෙනවා.
- පොල් අස්වැන්ට යෙදීමේදීද අස්වැන්න වැඩිකරගත හැක.
- කාබනික පොහොර,කෘමිනාශක නිශ්පාදනයටද අපසුදානම්.
- අඩි 03ක කැබලි ලෙස සකස් කළ කෝටු කිලෝවක් රුපියල් 02කට මිලදී ගන්නවා.
- කෝටු 3000ක් සිටුවීමෙන් රුපියල් 120000.00ක ආදායමක් ලබාගත හැක.

## BIO FILM ආයතනය

- මෙම කන්නයේදී ගොවි සංවිධාන ගණනාවකදීම දැනුවත් කිරීම සිදු කළා.
- මෙතෙක් මෙම දියර පොහොර පිළිබඳව චෝදනා ලැබී නොමැත.

**ස්තූති කථාව - ඒකාබද්ධ ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික තුමා.**

- මෙවර ව්‍යාපාර කමිටු රැස්වීම සාර්ථක කරගැනීමට පැමිණි සියළුම රාජ්‍ය නිළධාරීන් ගොවි සංවිධාන නිළධාරීන්ට ස්තූති කරමින් කමිටු රැස්වීම අවසන් කරන ලදි.

.......................................

ආර්.ටී.කේ රාජසූරිය,

නේවාසික ව්‍යාපාර කළමනාකරු,

කවුඩුලුවැව ව්‍යාපාරය,

මැදිරිගිරිය.

ආර්.ටී.කේ. රාජසූරිය
නේවාසික ව්‍යාපාර කළමණාකරු
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය
කවුඩුලුවැව ව්‍යාපාරය
මැදිරිගිරිය.

පිටපත් -

1. දිස්ත්‍රික් ලේකම් - පොළොන්නරුව. - කා.දැ.ස
2. අධ්‍යක්ෂ,වාරිමාර්ග කළමනාකරණ අංශය. - කා.දැ.ස
3. ප්‍රාදේශිය ලේකම්,මැදිරිගිරිය. - කා.දැ.ස
4. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
5. ගොවිජනසේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
6. කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ,පොළොන්නරුව. - කා.දැ.ස
7. අන්තර් පළාත් කෘෂිකර්ම නියෝජ්‍ය අධ්‍යක්ෂ. - කා.දැ.ස



මැණික්සොරොව්ව බෙදුම් ඇල ගොවි සංවිධානය